# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2258/24 - 2021 දෙසැම්බර් මස 15 වැනි බදාදා - 2021.12.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16 (2ඈ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

### කොල්ලුපිටියේ සිට දෙහිවල ඇළ දක්වා යෝජිත විනෝදාස්වාද වෙරළතීර/මුහුදුතීර සංවර්ධන ව්‍යාපෘතිය - අදියර 1

#### පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව

1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(1) වගන්තියේ විධිවිධානවලට අනුකූලව බත්තරමුල්ල, සෙත්සිරිපාය, දරන ලිපිනයේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද කොළඹ දිස්ත්‍රික්කයේ, කොල්ලුපිටියේ සිට දෙහිවල ඇළ දක්වා යෝජිත විනෝදාස්වාද වෙරළතීර/මුහුදුතීර සංවර්ධන ව්‍යාපෘතිය - 1 අදියර 1 සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්‍ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා 2021.12.15 වැනි දින සිට දින 30ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර).

මීට අමතරව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.coastal.gov.lk මගින් එම වාර්තාව භාෂා තුනෙන්ම පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇත.

01. වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, 12 වන මහළ, සෙත්සිරිපාය, දෙවන අදියරය, බත්තවරමුල්ල.

02. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, 4 වන මහල, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්, කොළඹ 10.

03. මධ්‍යම පරිසර අධිකාරිය, නො. 104, "පරිසර පියස", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

04. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ.

05. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - තිඹිරිගස්යාය.

06. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - දෙහිවල

07. මහනගර සභාව - කොළඹ.

08. මහනගර සභාව - දෙහිවල, ගල්කිස්ස.

09. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් කාර්යාලය, දෙහිවල.

10. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය කාර්යාලය, මොරටුමෝදර, මොරටුව.

මෙම යෝජිත ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2021.12.15 වැනි දින සිට දින 30 ඇතුළත වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

**ඉංජිනේරු ආර්. ඒ. එස්. රණවක,**
අධ්‍යක්ෂ ජනරාල්,
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය. 4 වන මහල,
මාලිගාවත්ත, කොළඹ 10.

දුරකතන අංක : 011 - 2449754, 011 - 2389722, 011 - 2449197.
ෆැක්ස් අංක : 011 - 2438005, 011 - 2472623.

EOG 12 - 0123

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.